දේවි බාලිකා විද්‍යාලය - කොළඹ
Devi Balika Vidyalaya - Colombo

පළමු වාර පරීක්ෂණය - 2012
First Term Test - 2012

සිංහල භාෂාව හා සාහිත්‍යය

11 ශ්‍රේණිය

පැය 1 1/2

නම : ..................................................................... විභාග අංකය : .................

1 - කොටස

* අංක 1 සිට 25 තෙක් ප්‍රශ්නවල දී ඇති (1) (2) (3) (4) උත්තරවලින් නිවැරදි උත්තරය තෝරා යටින් ඉරක් අඳින්න.

* අංක 1 සිට 2 තෙක් ප්‍රශ්නවල ඇති වාක්‍යයෙහි තදකළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය තෝරන්න.

01) **බොර දියේ මාළු අල්ලන්නට** සූදානම් වන්න එපායයි සභාවේ සිටි එක් කෙනෙක් මන්ත්‍රීවරයාට පැවසුවේය.
1. අහිංසකයන් පමණක් අල්ලා ගැනීමට
2. කැපවීමක් කිරීමට උත්සාහ දැරීමට
3. අවුල් සහගත තත්ත්වයේ ඵල නෙළා ගැනීමට
4. වරදකරුවන් වුවන්ට දැඩි දඬුවම් දීමට

02) පාසලට ලබාදුන් ක්‍රීඩාපිටිය විදුහලට **සුදුසු** අලියෙකු වී ඇති බැව් විදුහල්පති කීය.
1. නඩත්තු කිරීමට අපහසු
2. විදුබිමට ආලෝකයක් වූ
3. ඉතා විශාල එකක් වූ
4. වෙන කිසිම තැනක දක්නට නොලැබෙන

* අංක 3 සිට 4 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

03) දේශීය සංවර්ධනයට තරුණ ශ්‍රමය ................................ කර ගැනීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර ඇත.
1. උපහාර 2. උපමාව 3. උපයෝගි 4. උපචාර

04) යමෙකුගේ හැසිරීම් රටාව .............................. ඔහුගේ චරිත ලක්ෂණ මැනිය හැකි වේ.
1. විශ්ලේෂණයෙන්
2. අධීක්ෂණයෙන්
3. නිරීක්ෂණයෙන්
4. සමීක්ෂණයෙන්

* අංක 5 සිට 6 දක්වා ඇති වාක්‍යයන්හි හිස්තැන් පිරවීමට යෝග්‍ය වචන තෝරන්න.

05) මෑණියන් දෑ දියණිය සමඟ කඩවීදියට ..............................
1. යන්නීය 2. යයි 3. යනු ලබයි 4. යනදෑ ය

06) අසරණ අපට .............................. පිහිට වෙතැ'යි අපි විශ්වාස කළෙමු.

1. දෙවියෝ 2. දෙවියන් 3. දෙවිවරු 4. දෙවියෙක්

* අංක 7 සිට 8 තෙක් 'අ' යටතේ ඇති වාක්‍ය 'ආ' යටතේ ඇති වාක්‍ය ලෙස වෙනස් කිරීමේ දී හිස්තැනට ගැළපෙන පදය තෝරන්න.

07) අ) ශිෂ්‍යයෝ ප්‍රශ්න අසති

ආ) ශිෂ්‍යයන් විසින් ප්‍රශ්න ..............................

1. නැඟේ 2. නගයි 3. නගන ලදි 4. නැගෙති

08) අ) ළිඳට බැස්සා වූ තාත්තා බාල්දිය ගොඩගත්තේය.

ආ) ළිඳට .............................. තාත්තා බාල්දිය ගොඩ ගත්තේ ය.

1. බසිද්දී 2. බසින 3. බසින 4. බට

09) අකාරාදි පිළිවෙළට පද යෙදී ඇති වරණය තෝරන්න.

1. පැල්මඩුල්ල, කුණ්ඩසාලේ, දඹුල්ල, බෙන්තර
2. කුණ්ඩසාලේ, දඹුල්ල, පැල්මඩුල්ල, බෙන්තර
3. බෙන්තර, දඹුල්ල, පැල්මඩුල්ල, කුණ්ඩසාලේ
4. දඹුල්ල, බෙන්තර, කුණ්ඩසාලේ, පැල්මඩුල්ල

10) නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.

1. මර්දනය, පුස්ථකාලය, ආචාර්ය, කළමනාකරු
2. ඓතිහාසික, දෘෂ්ටිය, ඖෂධාලය, සම්ප්‍රදාය
3. ප්‍රස්ථාරය, ප්‍රදර්ශනය, ඡන්දය, ප්‍රබල
4. වලාකුළ, මද්‍යසාර, සමස්තය, සම්භාෂණය

11) එක් එක් පේළියේ මුලින් දැක්වෙන පදයේ අර්ථයට සමානාර්ථ පදයක් ඇතුළත් නොවන පද පේළිය තෝරන්න.

1. මුහුද - අර්ණවය, සමුදුර, රුවනාකාර, සිඳු
2. සතුට - අනඳ , ආහ්ලාද , ඔකඳ , තොස
3. පෘථිවිය - භූ , මිහි , ධරණී, පුවතර
4. නෙළුම් - අම්බුජ , කමල , තාමරස , පද්ම

12) මුලින් දී ඇති පදයට බහු අර්ථ පදයක් ඇතුළත් නොවන පද පේළිය තෝරන්න.

1. දිව - දිවයින , ප්‍රාණ, දූපත , දිව්‍ය
2. අත - අරුත , කෙරෙහි , කෙළවර , පැත්ත
3. අඹ - ජලය , මේසය , ලුහුබැඳීම , ස්ත්‍රිය
4. නා - ඇතා , නා ගස , සුළඟ , නාදය

* අංක 13 - 15 තෙක් වාක්‍යවල තද කළු අකුරින් මුද්‍රිත කොටස් කවර ව්‍යාකරණ වර්ගයට අයත්දැයි තෝරන්න.

13) යාචකයන්ට **ආහාරපාන** ලබාදීම යහපත් ක්‍රියාවකි.

1. අන්‍යාර්ථ සමාස
2. විශේෂණ සමාස
3. ද්කාරාර්ථ සමාස
4. අව්‍ය සමාස

14) **නාගරික** මිනිස්සු දුරකථන වැඩිපුර භාවිත කරති.

1. අව්‍ය පද
2. තද්ධිත
3. විභක්ති
4. සමාස

15) **කියත** උන් මෙතපුල - ආයේය ඇඳුරු ගුත්තිල

1. පූර්ව ක්‍රියා
2. මිශ්‍ර ක්‍රියා
3. අසම්භාව්‍ය ක්‍රියා
4. ප්‍රයෝජ්‍ය ක්‍රියා

* අංක 16 සහ 17 ප්‍රශ්නවල එක් එක් පේළියේ මුලින් දී ඇති පදය නිවැරදිව විසන්ධි කර ඇති වරණය තෝරන්න.

16)
1. මිහින්තලය - මිහින් + තලය
2. මෙහෙසුර - මෙහෙ + ඉසුර
3. වීරෝදාර - වීර + උදාර
4. උදරාබාධ - උදර + බාධ

17)
1. ඔබිනොබ - ඔබි + නොබ
2. ග්‍රාමෝදය - ග්‍රාම + උදය
3. මලසුන - මල් + සුන
4. වියවුල - විය + අවුල්

18) මෙම කවියෙහි දැක්වෙන හිස්තැන් සඳහා යෙදිය යුතු වචන අනුපිළිවෙළ ඇතුළත් වරණය තෝරන්න.

කඳු මත ගැඹුරු ළඳලු වැවී
මායා සිහින නිල් පාටින් .................... කැවී
පිබිදෙන .................... දැක ඕ උමතු නොවී
ගී ගැයුවාය සිය ................ ළගට වෙවී

1. සැමියා , වසන්තය, මිටියාවත, සුවඳ
2. සුවඳ , මිටියාවත, සැමියා , වසන්තය
3. මිටියාවත, සුවඳ , වසන්තය , සැමියා
4. සුවඳ , වසන්තය , මිටියාවත , සැමියා

19) පහත දැක්වෙන චරිත ඇතුළත් පාඩම් පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

* අදිකාරම් , දිනේෂ , සුද්දනා , කාලකණ්ණියා

1. වන ගැහැබ තුළ චාරිකා, දිවි මගට ඔවදන් , මඟබලමින්, උදුම්බරා
2. උදුම්බරා , මඟබලමින් , දිවිමඟට ඔවදන් , වන ගැබ තුළ චාරිකා
3. දිවි මඟට ඔවදන් , මඟ බලමින් , වන ගැබ තුළ චාරිකා , උදුම්බරා
4. දිවිමඟට ඔවදන් , උදුම්බරා , වන ගැබ තුළ චාරිකා, මඟබලමින්

20) පහත දැක්වෙන පද්‍ය පාඨයේ අදහස දැක්වෙන වරණය තෝරන්න.

හෙළන නගන අත නුවන'ග බැලුම් දිදී

1. ඔසවන පහතට දමන අත් දිහා ඇස් අගින් බලමින්
2. බැලුම් ඔසවමින් අත් දිහා ඇස්වලින් බලා
3. අතින් බැලුම් ගෙන ඇස් දිහා බලමින්
4. ඇස් අගින් බැලුම් දිහා බලා අත් ඔසවමින්

* 21 - 22 ප්‍රශ්නවල ඉදිරිපත් කර ඇති ව්‍යාකරණ විග්‍රහය අතුරෙන් වැරදි ව්‍යාකරණ විග්‍රහය සහිත වාක්‍ය තෝරන්න.

21)
1. ගුරුවරු සිසුන් යහමග යවති. මෙය කර්තෘකාරක වාක්‍යයකි.
2. කොඩි පෙළ සුළඟට සෙළවෙයි. මෙහි සමූහාර්ථවාචි පදයක් ඇත.
3. අපි ශ්‍රී ලාංකිකයෝ මෙය අවිනිශ්චිතාර්ථය සහිත වාක්‍යයකි.
4. මා එනවිට මහ වැස්සක් ඇදවැටුණි. මෙහි අසම්භාව්‍ය ක්‍රියාපදයක් ඇත.

22)
1. මම යන උක්ත පදයට යෙදිය හැකි අතීත කාල ක්‍රියා පදයක්වන්නේ කියවීමි යන්නයි.
2. ගොවියෙක් යන පදයේ අනුක්ත පදය ගොවියෙකු යන්නයි.
3. අප විසින් හොඳින් පාඩම් කෙරේ. මෙහි පාඩම් යන්න උක්ත කර්මයයි.
4. චාරිකාව සඳහා සහභාගි වන ළමයින් පැමිණ නැත. මෙහි ළමයින් යන්න වැරදිය.

* පහත 23 - 25 තෙක් ප්‍රශ්නවල නිවැරදි ව්‍යාකරණ සහිත වාක්‍ය තෝරන්න.

23)
1. සමහරෙක් රැස්වීමට සහභාගී වූහ
2. පියාණන් දැ දරුවන්ට අවවාද දෙයි
3. මා විසින් අභ්‍යාස සියල්ල කළෙමි
4. ඔවුහු ආවොත් මම ද එදිනට එමි

24)
1. බොහෝ බෞද්ධයින් සිංහලයෝ වෙති
2. සියලු සත්ත්වයෝ නිදුක් වෙහුවා
3. නෞකාවෝ ඈතට දියඹට ගියේය.
4. ඔවුන් එති'යි මම විශ්වාස කළෙමි

25)
1. උපදේශකවරු විසින් ක්‍රීඩකයෝ අමතන ලදහ
2. උපදේශකවරුන් විසින් ක්‍රීඩකයන් අමතන ලැබූහ
3. උපදේශකවරුන් විසින් ක්‍රීඩකයෝ අමතන ලදහ
4. උපදේශකවරු ක්‍රීඩකයන් විසින් අමතන ලදි

## 2 - කොටස

(01) ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

1. ආ) සිංහල හෝඩියේ වර්ගාක්ෂර ගණන කීයද ?
   ආ) පහත සඳහන් වචනවල පිල්ලම් පිළිවෙළින් නම් කරන්න.
   * රුවල        * ඖෂධ

2. පහත සඳහන් කවි පදවල ඉරි ඇඳි පදයන්හි විභක්ති නම් කරන්න.
   අ) මූසිල මෙපුර තට - නුවරක් නොවෙයි ඉඳිනට
   ආ) නොදනිත් දරුවන් ඇකයෙන් වැටුණා.

3. අ) වීදිවලට ජනී ජනයෝ පෙරහැර බොහෝ නැතිව බැලීමට අතුරු සිදුරු එක්වූහ.
   මෙම වචන ගළපා අදහස නිරවුල් වාක්‍යයක් ලියන්න.
   ආ) පහත සඳහන් වාක්‍ය කර්මාකරකයට හරවා ලියන්න.
   මම සැමවිට ම දරුවන් අගය කරමි.

4. අ) එකිනෙකට සමාන අර්ථ ඇති යුගල පදයක් ලියන්න.
   ආ) 'එකුන්විසි' යන්න දහනවය නම් තුදුස යනු කීයද ?

5. පහත දැක්වෙන පදවල විරුද්ධ පද ලියන්න.
   අ) නිරුදක - ..............................................
   ආ) ජනාකීර්ණ - ..............................................

6. අ) පොත බලන්නේ නිමල් ය. මෙහි බලන්නේ යන පදයේ වියරණය නම් කරන්න.
   ආ) 'තුන්බිය' යන පදය කවර ව්‍යාකරණ වර්ගයට අයත්ද ?

7. අ) පොල්ලත්ත
   ආ) නොයෙක්     යන පදවල සන්ධි නාමය ලියන්න.

8. 'ස්වභාව' යන්නට 'ඉක' ප්‍රත්‍යය එක්වීමෙන් 'ස්වාභාවික' යන්න සෑදේ නම් පහත දැක්වෙන පදවලට 'ඉක' ප්‍රත්‍ය එක්වීමෙන් සෑදෙන පද ලියන්න.
   අ) පරම්පරා - ..............................................
   ආ) විකල්ප - ..............................................

9. පහත දැක්වෙන අදහස්වලට ගැළපෙන ප්‍රස්තාව පිරුළු ලියන්න.
   අ) මහ හඩින් යමක් පැවසීම - ..............................................
   ආ) කුඩා දෙයින් වුවත් ලොකු විපතක් සිදුවිය හැකිය. - ..............................................

10. පහත දැක්වෙන ප්‍රාදේශීය ව්‍යාවහාරවල පොදුවේ භාවිත වන වචන ලියන්න.
   අ) පිඹුර - ......................................
   ආ) පල්ලැක්කිය - ......................................

(ලකුණු 20)

(02) පහත සඳහන් කවිය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

නිබඳ පුළුලුර වසන සිරිකත දිගු'ඹු කර යසහර — පැළැන්දූ
නොමඳ මහ මෙත් කුලුණු මිණි රැස් මෙපුරවර දෙව් විමන් — රැන්දූ
අමොද රස බස් මුව පියුම් ගැබ සපිරි මේ දිසාපති — සම්න්දූ
දෙපද වැඳගෙන පිහිට ඉල්ලා සිටිමි සහ මාගේ — බිලින්දූ

1. මෙහි සඳහන් අය පිහිට ඉල්ලා සිටින්නේ කාගෙන් ද ?
2. එම පුද්ගලයා සතු ගුණාංග දෙකක් ලියන්න.
3. මෙහි සඳහන් රූපකයක් ලියන්න.
4. මෙම කවියේ ඇතුළත් සර්ව නාම පදයක් උත්තම පුරුෂ ක්‍රියා පදයක් ලියන්න.
5. අමොද , සිරිකත යන පදවල අර්ථ ලියන්න.

(ලකුණු 10)

## 3 - කොටස

(01) 1 සිට 10 දක්වා ඇති සියලු ම ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

1. අ) 'අපටත් දවසක ඉරපායාදෝ' කෙටි කතාවේ සිරියාවතීට ලකුණු අඩු ව දෙන ගුරුතුමිය කවුද?

   ආ) 'වෙන එකක් නොවේ, තියෙන කැතකම. හැබැයි වැඩිකල් කරන්නාරින් නේ නෑ' මෙය කාහට කියන ලද්දක් ද ?

2. ගී දේවියට කැප කළ දොවොලසට — සම
   කුටියක සුවඳ දෙයි කළුවැල් කපුරු — දුම

   අ) ඉහත කවි දෙපේළිය සඳහන් කවි පන්තියේ රචනා කිනම් කාව්‍ය යුගයකට අයත් ද?

   ආ) මෙහි සඳහන් උපමාව හා උපමේය වෙන් කර ලියන්න.

3. 'මුන්ට ගරුකොට කියා ලසුකොට ගොඩ නගමි'

   අ) මෙහි සඳහන් 'මුන්' යනුවෙන් හඳුන්වන්නේ කවරෙක් ද ?

   ආ) මේ පාඨය සඳහන් මුල් පොත කුමක්ද ?

4. උපුල් කඩා ගෙන කන ලා — සුපුල්වත
   ළකල් කුසුම් දම් කරලා — එකල්වන
   නිමල් මෙ නුඹ සහ විදි සැප — විපුල්වන
   ..........................................................

   අ) මෙම කවියේ අවසන් පද පේළිය ලියන්න.

   ආ) උපුල් , ළකල් යන පදවල අර්ථ ලියන්න.

ැනට

5. අ) 'මහාමායා දේවිය දුටු සිහිනය' පද්‍ය පන්තිය උපුටාගත් ග්‍රන්ථය කුමක් ද ?
   ආ) එය අයත් වන්නේ කිනම් යුගයකට ද ?

6. අ) පියසේන ඇසූ ප්‍රශ්නයක් කාව්‍යය නිර්මාණය කාගේ ද ?
   ආ) මෙම කවි පන්තිය රචනාකොට ඇත්තේ කිනම් ආකෘතියකට ද ?

7. අ) 'උත්තරෝලිය වස්තුව' ඇතුළත් මුල් කෘතිය කුමක් ද ?
   ආ) එහි රචකයා කවුරුන් ද ?

8. 'ස්වාමිනි, තුලු තිලින් බත් පිඩක් නොලද්දෝ නම් මියෙත්ල'
   අ) මෙය කාගේ ප්‍රකාශයක්ද ?
   ආ) මෙහි දී 'ස්වාමීනී' කියා ආමන්ත්‍රණය කරන්නේ කාහට ද ?

9. 'අම්මේ , මම හරි බරකින් මිදුණා'
   අ) මෙසේ පවසන්නේ කවුරුන් ද ?
   ආ) මෙම පාඨය ඇතුළත් වන්නේ කිනම් පාඩමේ ද ?

10. සඳකිඳුරු දා කව, සද්ධර්මරත්නාවලිය කෘතිවල රචකයින් නම් කරන්න.

(ලකුණු